සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

පළමු වාර ඇගයීම
முதலாம் தவணைமதிப்பீடு - 2018
**First Term Evaluation**

| ශ්‍රේණිය / தரம் / Grade | 7 | විෂයය / பாடம் / Subject | බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper | I,II | පැය / மணித்தியாலம் / Hours | 02 |
|---|---|---|---|---|---|---|---|

නම ........................................................................ විභාග අංකය ......................................................

**අංක 01 සිට 20 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(1) බුදුරජාණන් වහන්සේ සත්සති ගත කිරීමේදී කළගුණ සැළකීමේ ආදර්ශය ලෝකයාට පෙන්වා දුන්නේ,

1. පළමු සතියේදී ය. 2. දෙවෙනි සතියේදීය.
3. තෙවන සතියේදීය. 4. සිවුවන සතියේ දීය.

(2) බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයෙන් සය වන සතිය ගත කළේ,

1. රුවන් ගෙයි ය. 2. මුජලින්ද නාග දරණය යටය.
3. අජපාල නුග රුක මූලය. 4. කිරිපලු රුක මූලය.

(3) බුදුරජාණන් වහන්සේගේ පළමු ලංකා ගමනය සිදුවූයේ,

1. බක් පොහෝ දිනකය. 2. වෙසක් පොහෝ දිනකය.
3. දුරුතු පොහෝ දිනකය. 4. පොසොන් පොහෝ දිනකය.

(4) බිම්බිසාර රජතුමා විසින් සිදු කළ, බුදු සසුනේ ප්‍රථම ආරාම පූජාව වනුයේ,

1. වේළුවනාරාමයයි. 2. ජේතවනාරාමයයි.
3. පූරවාරාමයයි. 4. නිග්‍රෝධාරාමයයි.

(5) නව අරහාදී බුදුගුණ ඇසුරින් බුදුගුණාලංකාරය රචනා කරන ලද්දේ,

1. තොටගමුවේ ශ්‍රී රාහුල හිමි ය. 2. වීදාගම මහා මෛත්‍රෙය හිමි ය.
3.අලගිය වන්න මුකවෙටි තුමාය. 4. වෑත්තෑවේ හිමි ය.

(6) බුද්ධත්වයට පත්වීමෙන් අනතුරුව බුදුන් වහන්සේ ඉසිපතනය කරා වඩින අතරමගදී හමුවූයේ,

1. උපතිස්ස පිරිවැජියා ය. 2. යසකුල පුත්‍රයා ය.
3. උරුවේල කාශ්‍යප ය. 4. උපක ආජීවකයා ය.

(7) බුදුරජාණන් වහන්සේ , ආනන්ද හිමියන් සමඟ එක්ව උණුපැන් සකසා , වණවී තිබූ සිරුර සියතින්ම පිරිසිදු කොට ඇප උපස්ථාන කළේ ,

1. සුනීතට ය . 2. පූතිගත්තතිස්ස හිමිට ය.
3. සෝපාකට ය. 4. මට්ටකුණ්ඩලීට ය.



LIVEWORKSHEETS

(8) මෛත්‍රිය වැඩීමෙන් ලැබෙන ආනිසංස ගණන වනුයේ,

1. එකොළහකි. 2. දොළහකි.

3. දහසකි. 4. විසි එකකි.

(9) බුදු සසුනේ අග්‍ර දායිකාව ලෙස හැඳින්වෙන්නේ,

1. ප්‍රජාපතී ගෝතමී ය. 2. යසෝදරාව ය .

3. විශාඛාව ය. 4.සුජාතාව ය.

(10) ලෝකයාට ධර්මය දේශනා කරන ලෙස බුදුරජාණන් වහන්සේට ඇරයුම් කළේ,

1.ශක්‍ර දෙවියන් ය. 2. බිම්බිසාර රජතුමා ය.

3. සටීකාර බ්‍රහ්මයා ය. 4. සහම්පතී මහා බ්‍රහ්මයා ය.

(11) බුදු රජාණන් වහන්සේගේ සරණ ලත් අයෙකි.

1.ආලවක 2. නාලාගිරි

3. සෝපාක 4. අංගුලිමාල

(12) "බුදුරජාණන් වහන්සේ දෙව් මිනිසුන්ගේ ශාස්තෘවරයා ය" , යන අදහස ඇතුළත් බුදුගුණ පාඨය වනුයේ,

1.සත්ථා දේවමනුස්සානං 2. ලෝකවිදූ

3. සම්මා සම්බුද්ධ 4. සුගත

(13) බුදුන් වහන්සේ ප්‍රථම ධර්ම දේශනාව පැවැත්වූයේ ,

1. සැවැත්නුවර ජේතවනයේදී ය. 2. මගධයේ වේළුවනයේදී ය

3. කුසිනාරාවේ උපවර්තනයේදී ය. 4. බරණැස ඉසිපතනයේදී ය.

(14) බුදුරජාණන් වහන්සේ අනන්ත ලක්ඛන සූත්‍රය දේශනා කරන ලද්දේ,

1. පස්වග මහණුන්ට ය. 2. ජටිල සහෝදරයන්ට ය.

3. භද්දවග්ගිය කුමාරවරුන්ට ය. 4. යසකුල පුත්‍රයා ඇතුළු පිරිසට ය.

(15) බෞද්ධ උපදෙස් රැසක් අපට ලබා දෙන බෞද්ධයාගේ අත්පොත නම්වූ , "ධම්ම පදය" ඇතුලත් වන්නේ සූත්‍ර පිටකයේ,

1. දීඝ නිකායට ය. 2. මජ්ඣිම නිකායට ය.

3. අංගුත්තර නිකායට ය. 4. ඛුද්දක නිකායට ය.

(16) මෙත් වඩන්නෙකු තුළ තිබිය යුතු උසස් ගුණාංගයකි,

1. ලද දෙයින් සතුටු නොවීම. 2. දක්ෂයෙකු නොවීම.

3. අනතිමානි බව 4. සන්සුන් ඉඳුරන් නැති බව.



LIVEWORKSHEETS

(17) විශාඛාව සෝවාන් වන විට ඇගේ වයස ,

1. අවුරුදු හයකි.  2. අවුරුදු හතකි.

3. අවුරුදු නවයකි.  4. අවුරුදු දහයකි.

(18) "සතුරු මිතුරු සැමට යහපතක් වේවා" යි ප්‍රාර්ථනා කරන්නේ,

1. මෛත්‍රී භාවනාවෙනි.  2. බුද්ධානුස්සති භාවනාවෙනි.

3. ආනාපානසති භාවනාවෙනි.  4. මරණානුස්සති භාවනාවෙනි.

(19) සුදත්ත සිටුතුමා , අනේපිඩු සිටුතුමා යන නමින් හැඳින්වූයේ,

1. සැම දෙනාගේම සිත් දිනාගත් අයෙකු වූ නිසාය.  2. සැමටම ප්‍රිය මනාප අයෙකු වූ නිසාය.

3.අනාතයින් උදෙසා ආහාරපාන පරිත්‍යාග තළ නිසාය.  4. මිතුරන්ට කළණ මිතුරකු වූ නිසාය.

(20) විපතක් වූ විට බොහෝ දෙනා බුදුගුණ සිහිකිරීමට පෙළඹෙති. එමගින් ඔවුන්ගේ,

1. ලැජ්ජාව දුරුවේ.  2. බිය දුරුවේ.

3. රාගය දුරුවේ.  4. මානය දුරුවේ.

(ල. 2 x 20 = 40)



LIVEWORKSHEETS